
## ගස් වලින් සිදුවන අනතුරුදායක තත්වය ඉවත්කිරීමේ ක්‍රියාවලිය



## 01.1 හැඳින්වීම

(අ) පළාත් පාලන ආයතන වෙත පැවරී තිබෙන කර්තව්‍යය අතර, ජනතාවගේ සුබ විහරණය, පහසුව, සුබ සාධනය හා සියලු පහසුකම් ආරක්ෂා කිරීම යන කරුණු ඇතුළත් වේ. මේ යටතේ යම් ගසකින් හෝ ඉන් කිසියම් කොටසකින් බාහිර තැනැත්තෙකුට ඇති විය හැකි අනතුරුදායක තත්වය ඉවත් කරවීම සඳහා පළාත් පාලන ආයතනයේ විධායක ප්‍රධානියා වෙත බලතල පැවරීම නීතියෙන් සිදු කර ඇත.

(ආ) මේ බලය ක්‍රියාත්මක කරවා ගැනීමට ඉල්ලුම් කරන යම් තැනැත්තෙකුගේ ඉල්ලීම සත්‍ය වශයෙන්ම නිවැරදි ද යන්න පරීක්ෂා කිරීමෙන් අනතුරුව පමණක් මේ බලතල ක්‍රියාත්මක කිරීම යෝග්‍ය වේ.

(ඇ) යම් අවස්ථාවක තැනැත්තෙකුගේ දේපළකට හෝ ජීවිතයට හානි සිදු විය හැකි යම් ගසක් සම්පූර්ණයෙන්ම කපා ඉවත් කිරීම අවශ්‍ය වන බවට කරුණු ඇති විට, ඒ ගස කපා ඉවත් කිරීමට නියෝගයක් නිකුත් කිරීමට පෙර, ඒ ගස 1956 අංක 9 දරන ගස් කපා හෙළීම පාලනය කිරීමේ පනත යටතේ සාදන ලද නියෝග වලින් තහනම් කර ඇති ගසක් ද නැති ද යන්න තහවුරු කර ගැනීම අත්‍යවශ්‍ය කාරණයකි.

(ඈ) ඇතැම් තැනැත්තන් අතර (ඉඩම් හිමිකරුවන් හෝ පවුල් අතර) පවතින පෞද්ගලික ආරවුල් සම්බන්ධ කර ගනිමින් මෙවැනි ඉල්ලීම් පළාත් පාලන ආයතනය වෙත ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක කරුණු පරීක්ෂා කිරීමෙන් පසුව, සත්‍ය වශයෙන්ම ඒ යම් ගසකින් අනතුරුදායක තත්වයක් පවතින්නේ නම් පමණක් මේ බලතල ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන ආයතනයේ විධායක ප්‍රධානියා සැලකිලිමත් වීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

## 01.2 නෛතික අධිකාරිය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 107 වන වගන්තිය.
(ආ) 1956 අංක 9 දරන ගස් කපා හෙළීම පාලනය කිරීමේ පනත.

## 01.3 සුදුසුකම්

පහත සඳහන් කරුණු සම්පූර්ණ වී ඇති අවස්ථාවක, ඒ තැනැත්තා මේ සහනය ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

(අ) අනතුරුදායක තත්වය පවතින ගස තමාට අයත් ඉඩමක පිහිටා නැති ගසක් විය යුතුය.
(ආ) ගස අයත් වන තැනැත්තා නොවන වෙනත් යම් තැනැත්තෙකුට, ඒ යම් ගසක අත්තකින්, කඳකින්, ගෙඩියකින් හෝ සම්පූර්ණ ගසෙන් අනතුරුදායක තත්වයක් පැවතිය යුතුය.

සටහන: ගස පවතින ඉඩමේ අයිතිය ඉල්ලීම කරන තැනැත්තා ද ඇතුලුව වෙනත් තැනැත්තන්ට ද හවුලේ පවතින ඉඩමක් වන විට හෝ ඒ ගස පවතින ඉඩමේ අයිතිය පිළිබඳ අධිකරණ ක්‍රියා මාර්ග ගනිමින් පවතින අවස්ථාවක හෝ ඉඩමේ අයිතිය පිළිබඳ ආරවුලක් පවතින අවස්ථාවක, ඒ ගසෙන් සිදු විය හැකි අනතුරුදායක තත්වය සම්බන්ධ ඉල්ලීමක් ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියා කිරීමට භාර ගැනීම නොකරනු ඇත. නමුත් අධිකරණයේ නඩුවක් විභාග වන අවස්ථාවක නඩුවේ පාර්ශවයන් වෙත මෙම තත්වය මෝසමක් මඟින් කරුණු වාර්තා කොට අධිකරණයේ අවසරය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

## 01.4 ගාස්තුව

පළාත් පාලන ආයතනය විසින් කලින් කල තීරණය කර ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලබන ඉල්ලුම් පත්‍ර ගාස්තුව.

## 01.5 ඉදිරිපත් කළ යුතු ලේඛන

මෙහි ඇමුණුමට අනුකූලව සකස් කළ ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

## 01.6 කාර්යය පටිපාටිය

| පටිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|
| ගාස්තුව අය කර ගෙන සම්පූර්ණ කළ අනතුරුදායක ගස් පිළිබඳ ඉල්ලුම් පත්‍රය භාර ගැනීම. | | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි හා මුදල් අයකැමි |
| ඉල්ලුම් පත්‍රය පිළිබඳ ඉදිරි කටයුතු සඳහා නියෝග ලබා ගැනීම. | ඉල්ලුම් පත්‍රය ලැබුණු දින | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි |
| නිරීක්ෂණ හා නිර්දේශ ලබා දෙන ලෙස නියෝග කිරීම. | ඉල්ලුම් පත්‍රය ලැබුණු දින | සභාපති / ලේකම් |
| ඉල්ලීම සම්බන්ධ තාක්ෂණ නිලධාරි මඟින් නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම. | ඉල්ලුම් පත්‍රය ලැබුණු දින සිට දින හතක් ඇතුලත | තාක්ෂණ නිලධාරි |
| තාක්ෂණ නිලධාරිගේ නිර්දේශ අනුව ගසේ හිමිකරුට හෝ පදිංචිකරුට / ඉල්ලුම්කරුට දැනුම් දීම. | නිර්දේශය ලැබුණු දිනම | සභාපති / ලේකම් / විෂය භාර නිලධාරි |
| නියෝගය අනුව කටයුතු කර ඇති බව තහවුරු කර ගැනීම. | නියෝගය මඟින් ලබාදුන් කාලය අවසන් වන දින. | තාක්ෂණික නිලධාරි / සභාපති / ලේකම් |
| නියෝග පැහැර ඇති විට /පළාත් පාලන ආයතනය මඟින් නියෝගය ක්‍රියාත්මක කිරීම. | ලිඛිත නියෝගය ලැබුණු වහාම | සභාපති / ලේකම් / බලය පවරන ලද නිලධාරි |
| අදාළ කාර්යය ඉටු කිරීමට දරන ලද වියදම ගණන් බලා ඒ මුදල ගෙවන ලෙස ඒ තැනැත්තාට ලිඛිතව දැනුම් දීම. | අදාළ කාර්ය නිම කළ දිනයේම | සභාපති / ලේකම් / විෂය භාර නිලධාරි |
| අදාළ මුදල ගෙවීම ඒ තැනැත්තා පැහැර හැර ඇති විට, ඒ මුදල අය කර දෙන ලෙස මහේස්ත්‍රාත් වෙත ඉල්ලීමක් ගොනු කිරීම. | අදාළ මුදල ගෙවීමට නියම කළ අවසන් දිනයට පසු දින | සභාපති / ලේකම් |

| පටිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|
| අදාළ මුදල දඩයක් වශයෙන් අය කිරීමට නියෝග නිකුත් කිරීම. | | මහේස්ත්‍රාත් |
| අදාළ මුදල වගඋත්තරකරුගෙන් අය කරගෙන ලදු පතක් නිකුත්කර, අයකරගත් මුදල සහා අරමුදලේ තැන්පත් කිරීම. | ගෙවීම් කළ දිනයේම | ලේකම් / විෂය භාර නිලධාරි |

සටහන: අනතුරුදායක ගස සම්පූර්ණයෙන්ම කපා ඉවත් කිරීමට නිර්දේශ ලැබී ඇත්නම් සහ ඒ ගස කපාහෙළීම තහනම් කළ ගසක් වන විට, ගසේ හිමිකරුට හෝ පදිංචිකරුට දැන්වීම කරන ලිපියේ පිටපතක් අදාළ කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ යුතුය.

**අනතුරුදායක ගස් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල, ගසක් කපා ඉවත් කිරීම සම්බන්ධයෙන් බලපවත්වන වෙනත් නීතිවල නියම සහ ඉල්ලුම්කරු විසින් දැන ගෙන සිටිය යුතු**

**<u>වෙනත් කරුණු සහ ඉල්ලුම්කරුට උපදෙස්</u>**

1. අනතුරුදායක ගස් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට බලතල ලැබී ඇත්තේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 107 වන වගන්තිය හෝ 255 අධිකාරිය නගර සභා ආඥා පනතේ 136 (ආ) වන වගන්තිය හෝ 252 අධිකාරිය මහා නගර සභා ආඥා පනතේ 127 (ඉ) වන වගන්ති මඟින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති යම් ගසකින් හෝ ගසක යම් අත්තකින්, කඳකින්, ගෙඩියකින් හෝ වෙනත් කිසිවකින් යම් ගොඩනැගිල්ලකට අලාභ හානි සිදුවන හෝ අලාභ හානි සිදුවන හෝ ඒ ගොඩනැගිල්ලේ පදිංචිකරුවකුට හෝ යම් ප්‍රසිද්ධ මාර්ගයක ගමන් ගන්නා අයගේ ආරක්ෂාවට අනතුරුදායක තත්වයක පවතින අවස්ථාවක, ඒ ගස හෝ එහි යම් කොටසක් පිළිබඳව ගත යුතු වඩාත්ම සාර්ථක ක්‍රියාමාර්ග ගැනීම පළාත් පාලන ආයතනයේ කාර්යය වේ.

2. යම් අනතුරුදායක ගසක් කපා ඉවත් කරන ලෙස නියම කිරීමට පළාත් පාලන ආයතන වල පනතෙන් බලය ලැබී තිබුණේ වුවද, ඇතැම් වර්ගවලට අයත් ගස් කපා හෙළීමට පෙර, ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් කලින් අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බවට තවත් නීතියකින් නියම කර ඇත. මේ යටතට අයත් වන්නේ කපා හෙළීම තහනම් කර ඇති ගස් වර්ග (කොස්, බුරුත ආදී - කපා හෙළීම තහනම් කර ඇති ගස් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් විමසා දැන ගත හැකි ය) වේ. මේ වර්ගයේ ගසකින් අනතුරුදායක තත්වයක් පවතින බව පළාත් පාලන ආයතනය නිගමනය කිරීමෙන් පසුව ඒ පිළිබඳව අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කර ඔහුගේ අනුමැතිය ද ලබා ගත යුතු බව සලකන්න.

3. කෙසේ වුවද, තමන්ගේම ඉඩම තුළ පවතින යම් ගසකින් තමන්ගේ නිවසට හෝ ඒ නිවසේ පදිංචිකරුවකුට අනතුරුදායක තත්වයක් පවතින අවස්ථාවක ප්‍රාදේශීය සභාව ඒ පිළිබඳව මැදිහත් නොවන බව කරුණාවෙන් සලකන්න.

4. එසේම යම් ගසකින් අනතුරුදායක තත්වයක් පවතින අවස්ථාවක, ඒ ගස පවතින ඉඩම නොබෙදූ ඉඩමක් වශයෙන් පවතින සහ ගසෙහි අයිතිය පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් ඇත්තේ නම් හෝ ඉඩම සම්බන්ධයෙන් නඩුවක් හෝ ආරවුලක් පවතින්නේ නම් එවිට, ඒ ගසෙන් පවතින අනතුරුදායක තත්වය පිළිබඳ පළාත් පාලන ආයතනයේ නිගමනය පමණක් නිකුත් කරනු ලබන අතර සිවිල් නඩු මාර්ගයෙන් හෝ සමථ මණ්ඩලය හෝ පොලිසියේ මැදිහත් වීමෙන් ඒ ගස සම්බන්ධ ඉදිරි කටයුතු කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

5. කිසියම් ඉඩමක වැට මායිම් ප්‍රශ්නයක් උද්ගත වීම නිසා හෝ වෙනත් යම් පෞද්ගලික ආරවුලක ප්‍රතිඵලයක් වශයෙන් සාවද්‍ය ලෙස යම් ගසක අනතුරුදායක තත්වයක් පවතින්නේ යැයි කෙරෙන ඉල්ලීම් පළාත් පාලන ආයතනයට ඉදිරිපත් නොකරන ලෙස ද කරුණාවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

6. අනතුරුදායක ගසක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රය සමඟ පෙරසැරි ගාස්තුවක් සහ පහත සඳහන් අනෙකුත් ගෙවීම් පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු ය.

| | |
|---|---|
| (අ) පෙරසැරි ගාස්තුව | රු. . . . . . . . . . . . . . |
| (ආ) රජය මඟින් නියම කරන ලද බදු මුදල් (ඇත්නම්) | රු. <u>. . . . . . . . . . . . .</u> |

7. කිසියම් ගසකින් අනතුරුදායක තත්වයක් පවතින අවස්ථාවක පමණක් පළාත් පාලන ආයතනය විසින් ඒ බව දන්වමින් අනතුරුදායක තත්වය ඉවත් කළ යුතු ආකාරය පිළිබඳව ඒ ගස හිමිකරු හෝ පදිංචිකරු වෙත නිවේදනයක් නිකුත් කරනු ලැබේ. එසේම ඒ අනතුරුදායක ගස, ගස් කපා හෙළීම පාලනය කිරීමේ පනත සහ / හෝ වනසත්ව හා වෘක්ෂලතා ආඥාපනත හෝ ඒ යම් නීතියක් යටතේ හෝ කපා හෙළීම තහනම් කර ඇති බව ප්‍රකාශයට පත් කරනු ලැබූ කිසියම් වර්ගයක ගසක් වන විට, ඒ නිවේදනයේ පිටපතක් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාට ද නිකුත් කරනු ලැබේ. මේ නිවේදනයේ පිටපතක් ඉල්ලුම්කරු වෙත ද නිකුත් කරනු ලබන අතර, ඒ පිටපත කොට්ඨාශයේ ග්‍රාම නිලධරයා වෙත ඉදිරිපත් කර ප්‍රාදේශීය ලේකම්වරයා තවදුරටත් දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතුය.